www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ගාසා අර්බුදය හා පලස්තීන ජාතිකවාදයේ අසමත්කම

**The Gaza crisis and the failure of Palestinian nationalism**

**කර්තෘ මන්ඩලය විසිනි**
**2007 ජූනි 20**

ඉස්ලාමීය ව්‍යාපාරයේ ජයග්‍රහනයෙන් කෙලවර වූ, ෆටා හා හමාස් සංවිධාන අතර සතියක් පුරා ගාසාහි පැවති සිවිල් යුද්ධයෙන් පසුව, පලස්තීන අධිකාරියේ ජනාධිපති මොහමඩ් අබ්බාස් විසින් නව ආන්ඩුවක් පිහිටුවීම හා හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීමත් සමග, බටහිර ඉවුර හා ගාසා තීරුව අතර පැවතියා වූ දේශපාලන බෙදීම තහවුරු විය.

හිටපු ලෝක බැංකු හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධරයකු වූ සලාම් ෆයාඩ් නමැති සිය අගමැති සමග අබ්බාස්, ජනාධිපති ආඥාවක් යටතේ පිහිටුවා ඇති ආන්ඩුව, එක්සත් ජනපදයේ හා ඊස්රායලයේ සෘජු භාරකාරත්වය හා එහි ඒජන්තයන්ගේ මෙහෙයවීම යටතේ පිහිටුවා ගැනුනකි.

අබ්බාස් යටතේ සේවාදායක පාලන තන්ත්‍රයක් පිහිටු වීම පලමු පියවර වන අතර මුලින් චෝදනා එල්ල වූයේ එය බටහිර ඉවුරේ හමාස් සංවිධානයේ දේශපාලන බලපෑම උදුරා දැමීම සඳහා එහි ප්‍රමුඛයන් වට ලා සිරගත කිරීමත් සමග අරඹා තිබුනු බවටයි. ෆටා තුවක්කුකරුවන් හා රමල්ලා හා නැබ්ලූස් හි හමාස් පාලනයේ පැවති ආයතනවලට කඩා වැදී ඇත. හමාස්හි සන්නද්ධ අංශය වන ඉසඩීන් කසාම් හා එහි පැරාමිලිටරි විධායක අංශය නීති විරෝධී කරමින් අබ්බාස්, ජනාධිපති නියෝග මාලාවක් පනවා තිබේ.

බටහිර ඉවුරට පනවා ඇති ජාත්‍යන්තර සම්බාධක ඉවත් කර අබ්බාස්ට මූල්‍ය පිටුබලය සපයන බවට එක්සත් ජනපදය, ඊස්රායලය හා යුරෝපීය සංගමය දැනටමත් ඇඟවුම් කර ඇත. කෙසේ වුව ද ගාසාහි වෙලඳ හා මිලිටරි අවහිර කිරීම් නිසා මිලියන එකහමාරක් වන පලස්තීනුවන් මුහුන පා සිටින දැඩි දුගීභාවය හා ආහාර හිඟය තවත් උග්‍රවනු ඇත.

මෙම පියවරයන්, ගාසාව එල්ල කර ගත් දේශපාලන ආර්ථික හා මිලිටරි වැඩ පිලිවෙලක පෙර නිමිත්තක් පමනි.

ඊස්රායලය හා ඊජිප්තුව ගාසාහි දේශ සීමා වසාදමා ඇති අතර ඉන්ධන සැපයුම නතර කරන බවට ඊස්රායලය තර්ජනය කරයි.

පෙර දිනයේ දී, ෆටා හා හමාස් අතර සටන් ඇවිලී යාමෙන් පසු පලමු වරට, ඊස්රායල් යුද ටැංකි ගාසාව තුලට ඇතුල්විය. පලා යන ෆටා ආධාරකරුවන් 500ක් පමන දින පහක් තිස්සේ කොටු වී සිටි ඉරෙස් (බේට් හැනවුන්) මුර කපොල්ල හරහා යුද ටැංකි ගමන් ගත්තේ ය. ඊස්රායල හමුදා බුල්ඩෝසරයක් කොන්ක්‍රීට් බැමි බිඳ දැමූ අතර එහි වෙඩි හුවමාරුවක් ද සිදු විය.

ඊස්රායල ආරංචි මාර්ග පැවසුවේ ගාසා තීරුවෙහි මෙම යුද ටැංකි රඳවනු ඇත්තේ "සීමිත කාලයකට" බවයි. එහෙත් බ්‍රිතාන්‍ය සන්ඩේ ටයිම්ස් වාර්තා කලේ, සති කිහිපයක් ඇතුලත මූලික ප්‍රහාරයක් ඊස්රායලය විසින් සැලසුම් කරන බවයි.

"හමාස්හි මිලිටරි ශක්තිය දින ගනනක් තුල බොහෝ දුරට විනාශ කිරීම" අරමුනු කොට ගෙන 20,000ක හමුදාවක් සහිත ප්‍රහාරයක විස්තර ඊස්රායල මිලිටරි ආරංචි මාර්ගවලින් ටයිම්ස් පුවත්පත උපුටා දක්වයි. "එය ඊස්රායලයට එල්ල කෙරෙන හමාස් සංවිධානයේ රොකට් ප්‍රහාරයන් හෝ සියදිවි නසා ගන්නා බෝම්බ සිද්ධීන් මුල් කර ගෙන සිදුවිය හැක." ඊස්රායලයේ ලේබර් පාක්ෂික එහුඩ් බරාක්, සන්නද්ධ සේනාංක දෙකක් ද ස්වයංපාලිත ගුවන් යානා හා එෆ් 16 ප්‍රහාරක ජෙට් යානා මගින් සැදුම්ලත් පාබල සේනාංකයක් යෙදවීම පිලිබඳ විස්තරාත්මක සැලසුම් ඉල්ලා ඇත. බරාක්ට සමීප ආරාංචි මාර්ග පවසා ඇත්තේ "ප්‍රශ්නය වන්නේ ප්‍රහාරයක් එල්ල කෙරෙනු ඇත්ද යන්න නොව එය සිදුවන්නේ කවදා ද? කෙසේ ද? යන්නයි. හමාස් සංවිධානය තලා දැමීමේ ඊස්රායල උත්සාහයට සහාය දක්වන අතර, ඉරානයට එරෙහි මිලිටරි මැදිහත්වීමක් ඉල්ලා සිටිමින් "ශිෂ්ටාචාරයන්ගේ ගැටුමකට" එය සම්බන්ධ කරන්නා වූ මාධ්‍යයන් හි නිරන්තරයෙන් පලවන වාර්තා, තවමත් වඩා අනතුරුදායක වේ.

## එක්සත් ජනපදය හා ඊස්රායලය සිවිල් යුද්ධය උසිගැන්වීම

එක්සත් ජනපදයේ හා ඊස්රායලයේ දේශීය පොලිස්කාරයෙකු හා අතලොස්සක් දසලක්ෂපතියන්ගේ නියෝජිතයා ලෙසත්, බොහෝ දෙනෙකු විසින් දැක ගනු ලැබූ ෆටා සංවිධානයේ දූෂිත හා ගැති භාවය පිලිබඳ පැතිරුනු අතෘප්තියේ මූලික ප්‍රතිඵලයන් ලෙස, 2006 ජනවාරි මැතිවරනයෙන් හමාස් සංවිධානය බලයට පත් විය.

ප්‍රජාතන්ත්‍රීය මැතිවරන ප්‍රතිඵලය පිලිගැනීම ප්‍රතික්ෂේප කල බටහිර බලයන්, ආන්ඩුව ඇද දමා අබ්බාස් විසින් මුලුමනින්ම පාලනය කරන්නා වූ

ආන්ඩුවක් ඇටවීමේ අරමුන ඇතිව සම්බාධක පැනවීය. එක්සත් ජනපදයේ හා ඊස්රායලයේ ගනන් බැලීම් හැමවිටම පදනම් වූයේ ෆටා හා අබ්බාස්ගේ සැලකිය යුතු ආරක්ෂක හමුදාවන් හමාස් සංවිධානයට එරෙහිව පිහිටුවීමට ය. මෙහි දී ඔවුන්ගේ ගනන් බැලීම වැරදී ගියේ ෆටා සංවිධානය කෙරෙහි ගාසා හි පැවති මහජන වෛරයේ පරිමාව පිලිබඳ අඩු තක්සේරුවත් ෆටා හි ප්‍රහාරක ශක්තිය පිලිබඳ අධිතක්සේරුවත් නිසා ය.

පලස්තීනුවන් බුෂ් පරිපාලනයේ 'මාර්ග සිතියම' වැඩ සටහනට ගැටගැසීමේ ද, ඊස්රායලය විසින් නිර්දේශිත, එනම් බටහිර ඉවුරේ වැඩි කොටසක් ස්ථිර ලෙස ම ඈඳාගැනීමත්, පලස්තීන සංක්‍රමනිකයන්ට ආපසු පැමිනීමට ඇති අයිතිය පිලිකෙව් කිරීමත්, ඇතුලු කොන්දේසි සමග එකඟතාවකට යෑමේ ෆටාහි උත්සාහයන් කෙරෙහි පැවති දේශපාලන විරුද්ධත්වයෙන් හමාස් සංවිධානය වාසි ලැබීම ය. එහෙත් පලස්තීනුවන් සඳහා ශක්‍ය විකල්පයක් හමාස් සංවිධානය ඉදිරිපත් නොකලේ ය. ආගමික මූලධර්මවාදය වැලඳ ගැනීම ද අතුලු එහි ඉදිරිදර්ශනය අවශ්‍යයෙන්ම ජාතිකවාදයේ වඩාත් අන්ත රූපාකාරයක් විය. එය හසුරුවනු ලැබුවේ ආරාබි ධනේශ්වර කොටස්වල උත්සුකයන්ගෙන් මිස කම්කරුවන්ගේ හා ගොවීන්ගේ අවශ්‍යතාවන්ගෙන් නොවේ.

එහි ආගමික උමතුව පැතිරවීමේ වැඩපිලිවෙලට ද මැඩගත නොහැකි යුදෙව් විරෝධයට හා ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ද ෆටා සංවිධානය කෙරෙහි අල්ප වූ හෝ මිත්‍යාවක් පැවති පලස්තීනුවන් විශාල සංඛ්‍යාවක් විසින් විරුද්ධත්වය දක්වන ලදි. තව ද එය, සිය අරාබි අසල්වාසීන් සමග සාමයට ලැදියාවක් දැක් වූ ලක්ෂ සංඛ්‍යාත ඊස්රායල් කම්කරුවන්ට ද ගැඹුරින්ම සතුරු විය. සත්තකින් ම, යුදෙව් හා අරාබි කම්කරුවන් අතර දේශපාලනිකව ඒකාබද්ධ අරගලයක මොන යම් හෝ හැකියාවක් වලකාලීම පිනිස සැලසුම් කෙරුනු මීට වඩා හොඳ පිලිවෙත් පිලිබඳව සිතා ගත නොහැකි ය.

තවද එහි පුරසාරම් හා අතරින් පතර කෙරෙන සන්නද්ධ ක්‍රියාවන් තිබිය දී ම, හමාස් සංවිධානය, මැද පෙරදිග අධිරාජ්‍යවාදීන් සැලසුම් කල රාජ්‍ය පද්ධතියට බැරෑරුම් විරෝධයක් නො දක්වන අතර ම, එක්සත් ජනපදය හා ඊස්රායලය සමග තමන්ගේ ම ගනුදෙනුවක් සඳහා බලා සිටියි.

## ජාතිකවාදයේ අවසන් තැන

අවසානයේ දී ඊස්රායලය පසෙකින් පලස්තීන රාජ්‍යයක් ගොඩනැගීම සඳහා පොරොන්දුවෙමින් 1993 දී අත්සන් තැබූ ඔස්ලෝ ගිවිසුම, මෙම වර්ධනයන් මගින් නිශ්චිත අවසානයකට ගෙනවිත් තිබේ. එම " රාජ්‍ය දෙකක විසඳුම" නම් ඊනියා ගිවිසුම අත්සන් තැබුවේ, යසර් අර්ෆත් යටතේ ෆටා සංවිධානය විසින් ය. පලස්තීනුවන් දැන් අම්හිරි ලෙස කතාකරන "රාජ්‍ය ත්‍රිත්වයක විසඳුම" නම් එයයි.

වඩාත් මූලිකවන්නේ ඊස්රායලයේ මැඩිය නොහැකි වූ මර්දනකාරිත්වයට එරෙහිව පලස්තීනුවන් ගෙන ගිය අරගලය පදනම් කර ගත් ජාතිකවාදී ඉදිරිදර්ශනය අවසාන වසයෙන් බිඳ වැටීම, ගාසා හා බටහිර ඉවුර අතර භේදය මගින් නියෝජනය කිරීමයි.

පලවාහැරීමට හා මිලිටරි වාඩි ලෑමට එරෙහිව දශක හයක් තිස්සේ ගෙනගියා වූ අරගලය පලස්තීනුවන් අතර ම හටගත් භ්‍රාතෘඝාතක ගැටුමකට පරිවර්තනය වීමේ දී, ශෝචනීයත්වයේ ඉමහත් පරිමාවක් අත් කර ගනියි. එහෙත්, පලස්තීන ජාතික ව්‍යාපෘතියේ බිඳ වැටීම, නොවැලැක්විය හැකි පරිදි ම පලස්තීන කම්කරුවන් හා තරුනයන් මෙන් ම, ඊස්රායලය යුදෙව් රාජ්‍යයක් ලෙස පිහිටුවූ තැන් පටන් කලාපය වෙලාගෙන තිබෙන හිංසනයේ, මරනයේ හා ප්‍රචන්ඩත්වයේ චක්‍රයෙන් ඉවතට මගක් සොයන ඔවුන්ගේ ඊස්රායල් සමගාමීන් ද, දිරිගන්වා ඇත.

ෆටා සංවිධානයේ ඓතිහාසික අසාර්ථකත්වයන්, එය වොෂින්ටනයේ සූනම්‍ය උපකරනයක් බවට පත්වීමේත්, දේශපාලනික පාඩම් උකහාගැනීම අත්‍යාවශ්‍ය ය. එහි හදවතෙහි ම ඇත්තේ, පලස්තීන ජනතාව මත පටවා ඇති මරාලය, දූෂනයේ ප්‍රතිඵලයක් නොව ෆටා හි ධනපති ජාතිකවාදී ඉදිරි දර්ශනයේ පදනම මත, ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් මෙන්ම සමාජ අපේක්ෂාවන් ද සුරැකිය නොහැකිවීමෙන් ගලා එන්නකි.

වර්තමාන හිරවීම පෙන්නුම් කරන්නේ පලස්තීන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා සමාජ අවශ්‍යතාවන්, සමස්ත අධිරාජ්‍යවාදී සැකැස්මට ම හා එය අනුගමනය කරන අරාබි ධනේශ්වර රාජ්‍යයන්ගේ මෙන්ම ඊස්රායලයේ ද පාලන තන්ත්‍රයන්ට එරෙහිව සමාජවාදී මැදපෙරදිගක් සඳහා වූ පොදු අරගලයක් තුල අරාබි හා යුදෙව් වැඩ කරන ජනතාව එක්සත් කරන ක්‍රියා මාර්ගයකින් තොරව, සහතික කල නොහැකි බවයි.

## ඓතිහාසික පාඩම්

ෆටා සංවිධානය පලස්තීන විමුක්ති සංවිධානයේ (පීඑල්ඕ) නායකත්වයට පත් වූයේ එකිනෙකා සමග තරගකාරී විවිධ ජාතික ව්‍යාපාරයන්ගෙන් වඩාත්ම පෙරලිකාරී කොටස නියෝජනය කරමිනි. ඊස්රායලයට එරෙහි සන්නද්ධ අරගලයේ දී එහි අධිෂ්ඨානශීලි මගපෙන්වීම හේතු කොට ගෙන පලස්තීන ජනතාවගේ පුලුල් කොටස් අතර එය ජනතා පදනමක් ගොඩනගාගත්තේ ය.

යුදෙව් රාජ්‍යයක් ලෙස ඊස්රායලය පෙරලා දැමීම සඳහා අවශ්‍ය කෙරෙන යුදෙව් හා අරාබි කම්කරුවන් අතර එක්සත්කම සඳහා පදනමක් සැපයීමට එහි ලෝකායත ප්‍රජාතන්ත්‍රවාදී පලස්තීනයක ඉදිරිදර්ශනයට, කිසි විටෙකත් නොහැකි විය. එවන් මූලික දේශපාලන අරගලයක් අවශ්‍යයෙන්ම පදනම් විය යුත්තේ සමාජවාදී විප්ලවයේ ඉදිරි දර්ශනය මත

ය. එය, පලස්තීන හා යුදෙව්වන් පමනක් නොව මැදපෙරදිග සියලු ජනතාව අධිරාජ්‍යවාදයේ මෙන්ම පන්ති පීඩනයෙන් ද විමුක්ත කර ගැනීම අරමුනු කර ගත යුතු විය.

මැදපෙරදිග මත සිය ආධිපත්‍යය පවත්වාගැනීමේ දී, ඊශ්‍රායල් ධනේශ්වරය, අධිරාජ්‍යවාදයේ එක් දේශීය ඒජන්තයෙක් පමනක් විය. ජනතාව මත තමන්ගේ ම ආඥාදායක පාලනය බලගන්වන විවිධ අරාබි රාජ්‍යයන් ද ඒ අතර වෙයි.

එහෙත් ෆටා හා පීඑල්ඕව යන දෙක එක්ව ගත්ත ද එයට, ඊශ්‍රායලයට හා අරාබි ධනේශ්වරයට එරෙහිව කම්කරු පන්තිය හා ගොවි ජනතාව දේශපාලනිකව ස්වාධීනව බලමුලුගැන්වීමට හැකියාවක් නොවී ය. විශාල කම්කරු පන්තික හා ගොවි සාමාජිකයන් ද, මංමුලාවට පත් සමාජ ස්තරයන් ද ගැබ්කර ගත්ත ද ෆටා සංවිධානය අවසාන වසයෙන් පාලනය කලේ පිටුවහලේ සිටි පලස්තීන ධනපතියන් ය. එය, ඔවුන්ගේ දේශපාලන නියෝජිතයෙක් බවට පත් විය.

රැඩිකල් ප්‍රවනතාවන් රොත්තක් ම සන්නද්ධ අරගලය උත්කර්ෂයට නංවන අතරතුර ම, ත්‍රස්තය කෙරෙහි එහි නැඹුරුව ද සහිත පීඑල්ඕවේ මිලිටරි ව්‍යාපාරය ගෙනගියේ මැදපෙරදිගෙහි අධිරාජ්‍යවාදී ආධිපත්‍යයෙන් යුත් රාජ්‍ය පද්ධතිය තුල, පලස්තීන ධනේශ්වරය සඳහා තැනක් සහතික කර ගනු වස්, අධිරාජ්‍යවාදය සමග සාකච්ඡාමය විසඳුමකට පැමිනීමේ අරමුන සහිතව ය.

අධිරාජ්‍යවාදය කෙරෙහි වූ ෆටාහි විරුද්ධත්වය සැමවිට ම ප්‍රාග්ධනයේ ආධිපත්‍යයට තර්ජනයක් විය හැකි, කම්කරු පන්තියේ කුමන ව්‍යාපාරයක හෝ වර්ධනය වැලැක්වීමේ කොන්දේසියට යටත් විය. මේ අන්තය දක්වා, ජාතික අරගලයේ දී පලස්තීනුවන් අතර අන් සියලු මතභේද ඉවතලිය යුතුය යන මූලධර්මය ද තමන් "පලස්තීන ජනතාවගේ එකම නීත්‍යනුකූල නියෝජිතයා" ය යන එහි ආස්ථානය ද පීඑල්ඕව අවධාරනය කලේ ය. එහි ප්‍රඥප්තියෙන් අවධාරනය කලේ "සියලු අරාබි රාජ්‍යයන් සමග සහයෝගිතාව" ද "ඔවුන් අතර මධ්‍යස්ථ පිලිවෙතක් ගෙන යන" බව ද "කුමන රාජ්‍යයක හෝ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවන බව ද" ය.

පීඑල්ඕව අරාබි පාලක පැලැන්තීන්ට අභියෝග කිරීම ප්‍රතික්ෂේප කිරීම නිසා ජාති, ආගම් හා වාර්ගික බෙදීම්, - සියල්ලන්ටත් වඩා යුදෙව්වන් හා අරාබීන් අතර - කපාගෙන යන, පන්ති පදනමකින් යුත් අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරයක වර්ධනය වලක්වනු ලැබින. අරෆත් හා ඔහුගේ සගයන් විසින් පෙන්නුම් කල සියලු කැපකිරීම් හා වීරත්වය තිබිය දී ම ෆටා සංවිධානය, විවිධ අරාබි පාලන තන්ත්‍රයන්ට ඊශ්‍රායලය සමග භූමිභාගයක් පිලිබඳව පැවති ගැටුම්වල මැදට "පලස්තීන ප්‍රශ්නය" ගෙන ඒම තුලින් තමන්ට සහාය ලබාගැනීමේ නිරන්තර උපාමාරු දැමීමේ ප්‍රතිපත්තියකට සිඳවනු ලැබින.

කටුක ඓතිහාසික අත්දැකීම පෙන්නුම් කරන්නේ, පලස්තීන ජනතාව යටත් කර තැබීම පුලුල් මිනුමකට අනුව පවත්වාගෙන ගියේ අරාබි ධනපතියන්ට පින් සිදුවන්නට බවය.

ලෝක පරිමානව නම්, තෙලින් පොහොසත් මැදපෙරදිග ආධිපත්‍යය දැරිය යුත්තේ කවුරුන්ද යන්න තීරනය කිරීමේ දී එක්සත් ජනපද අධිරාජ්‍යවාදය හා සෝවියට් ස්ටැලින්වාදී නිලධරය අතර උපාමාරු දැමීම මත රැඳී සිටීමට පීඑල්ඕවට සිදුවූයේ, එහි ජාතිකවාදී ඉදිරිදර්ශනය නිසාවෙනි. අවසානයේ දී අරාබි රාජ්‍යයන්ට ඊශ්‍රායලයට අභියෝග කිරීමේ හැකියාව රැඳී පැවතුනේ එක්කෝ සෝවියට් සංගමයේ මිලිටරි පිටුබලයෙන් හෝ සෝවියට් බලපෑම වැඩියාමේ තර්ජනය මත පදනම් ව එක්සත් ජනපදය මත පීඩනය යෙදීමේ ඔවුන් සතු හැකියාව මත ය.

## 1973 යොම් කිපූර් යුද්ධය

මැදපෙරදිග හා ලෝක දේශපාලනයේ සන්ධිස්ථානයක් වූ බව සනාථ කල 1973 යොම් කිපූර් යුද්ධය, පලස්තීන ජාතික ව්‍යාපාරයේ දේශපාලන වාසනාව සම්බන්ධයෙන් ද වැදගත් විය. ඊජිප්තුව හා සිරියාව ලැබූ ආරම්භක මිලිටරි ජයග්‍රහනයන්ගෙන් පසුව, ඊශ්‍රායලයේ පරාජය වැලැක්වීමට එක්සත් ජනපදය තීරනාත්මක ලෙස මැදිහත් විය. තමන්ගේ පාර්ශ්වයෙන් මැද පෙරදිග හා ජාත්‍යන්තරව "බල තුලනය" රැකගැනීම සඳහා වොෂින්ටනය පිටුපසින් පැමිනි සෝවියට් සංගමය අවධාරනය කලේ 1967 සය දින යුද්ධයෙන් පසුව ඊශ්‍රායලය වාඩි ලා ගත් බටහිර ඉවුර හා ගාසා තීරය ඇතුලු භූමිභාගයන්හි පාලනය ටෙල්අවිව් වෙත පැවරෙන පරිදි සටන් විරාමයක් ඇති කල යුතු බවය.

ඊජිප්තු ජනාධිපති අන්වර් සදාත් නිගමනය කලේ ඊශ්‍රායලය ආරක්ෂා කිරීම දැන් මැදපෙරදිග එක්සත් ජනපද ප්‍රතිපත්තියේ මුල් ගලක් බවට පත්ව ඇති බැවින් ඊශ්‍රායලය සමග සෘජු ගැටුමක් පිලිබඳව තවදුරටත් සිතාබැලිය නොහැකි බවයි. 1979 ඊජිප්තු ඊශ්‍රායල් සාම ගිවිසුම හා 1978 කැම්ප් ඩේවිඩ් සම්මුතිය අත්සන් තැබීමත් සමග ඔහු ඊශ්‍රායලය පිලිගැනීමේ ප්‍රමුඛයා බවට පත් විය.

එසේ කිරීම සම්බන්ධයෙන් විවිධ අරාබි බලයන් ඊජිප්තුව හෙලාදුටු නමුත්, ලෙබනනයේ පාලනය පිලිබඳව සිරියාව සමග ගැටුම හැරෙන්නට, 1973න් පසුව ඊශ්‍රායලය යලි කිසි විටෙකත් අරාබි රාජ්‍යයන්ගේ බැරෑරුම් අභියෝගයකට මුහුන නො දුන්නේ ය. ඒ වෙනුවට, ඉරාකය, ලිබියාව, සිරියාව හා සවුදි අරාබිය, ඊශ්‍රායලය පිලිගැනීම කෙරෙහි සෝෂාකාරී ලෙස විරෝධය පෑමට සීමා වූ අතර පීඑල්ඕව තුල වර්ජකවාදී පෙරමුන වැනි විරුද්ධවාදී ප්‍රවනතාවන් සංවිධානය

කලේ (ආරම්භයේ දී පීඑල්ඕව "ද්විත්ව රාජ්‍ය විසඳුමක්" දෙසට ගත් පියවරයන්ට එරෙහිව) ය.

මෙම රඟපෑම, පලස්තීනුවන්ට එරෙහි ඊස්රායලයේ හිංසනය කෙරෙහි අරාබි තන්ත්‍රයන්ගේ නොතැකීමට ද, ජෝර්දානය විසින් පලස්තීනුවන් ඝාතනය කල 1970 "කලු සැප්තැම්බරය ද, 1975 දී කැරන්ටිනා හා ටෙල් අල් සාටාර් කඳවුරුවල පලස්තීනුවන්ට එල්ල කල ලෙබනන් ෆැලැන්ජිස්ට් ප්‍රහාරය හා ඝාතනය කෙරෙහි සිරියාවේ නොතැකීම ද, ඇතුලුව ඔවුන්ම පීඑල්ඕවට එල්ල කල ඍජු ප්‍රහාරයන්ට ද පැහැදිලිව ම ප්‍රතිකූල විය.

එක්සත් ජනපදයේ පිටුබලය සහිතව පීඑල්ඕව පලවාහැරීම සඳහා 1982 දී ඊස්රායලය ලෙබනනය ආක්‍රමනය කල අවස්ථාවේ සිරියාවේ ධනපති තන්ත්‍රය කිසිවක් නොකල අතර, පීඑල්ඕවට ටියුනිස් කරා පිටුවහල් වීමට බලකෙරුනු අතර අසරන භාවයට පත්විය. මෙම ද්‍රෝහිත්වය වෙනුවෙන් පලස්තීන සරනාගතයන් ගෙවූ මිල නම් සබ්රා හා ෂටිල්ලා හි ඝාතනයන්ය.

එය, ස්ටැලින්වාදී නිලධරය ධනේශ්වර පුනස්ථාපනය වෙත හා ඉන් පසුව සෝවියට් සංගමය අවසන් කිරීම වෙත හැරී සිටි අවධිය වූ අතර, එය, ඊස්රායලය සමග සම්මුතියකට යෑමට එරෙහිව සිටගැනීමට පීඑල්ඕවට කිසියම් හැකියාවක් පැවතුනේ නම් එය නිශ්චිත අවසානයකට ද, ගෙන ආවේ ය.

වාඩිලාගත් ප්‍රදේශවල කම්කරුවන් හා තරුනයන් තමන් මුහුන පෑ නොඉවසිය හැකි කොන්දේසි නිසා නිරන්තරයෙන් නැගී සිටීමේ ඉන්ටිෆාඩා ව්‍යාපාරයේ පසුබිම තුල අරෆාත්, අවසන් මංමුලා සහගත කේවලයට එනම් ඊස්රායලය සමග සම්මුතියක් ඇති කර ගැනීම සඳහා වොෂින්ටනයෙන්ම සහයෝගය ඉල්ලා සිටීමේ තැනට බැසගත්තේ ය.

ක්ලින්ටන් පරිපාලනය ප්‍රතිචාරය දැක්වූයේ, ඊස්රායලයේ ආරක්ෂාව සහතික කරන, ඊස්රායලය සමග ඇති කර ගන්නා සාම සම්මුතිය "අන්තර්වාර උපායක් නොව මූලෝපායක්" බව පිලිගනිමින් සියලු ආකාරයේ ත්‍රස්තවාදය අත් හරින බවට ප්‍රකාශනයකට අත්සන් තැබීම සඳහා අරෆාත්ට බල කරමිනි. මාධ්‍ය හමුවක දී ඔහුගෙන් ඊස්රායලය පිලිගන්නා බව ප්‍රකාශකරන මෙන් ඉල්ලාසිටි විට අරෆාත් ප්‍රකට ලෙස විමසුවේ "ඔබට ඕනෑ කරන්නේ කුමක් ද? ඔබට අවශ්‍ය මා රෙද්ද උනා නටනු දැකීම ද?" යනුවෙනි.

අරෆාත්ගේ පිලිගැනීමට ලක් වූ එක්සත් ජනපදයේ නිර්දේශය, අරෆාත් සාක්ෂ්‍යකරුවෙකු ලෙස සිටිමින් අබ්බාස් විසින් අත්සන් තැබූ 1993 ඔස්ලෝ ප්‍රඥප්තිය මගින් පලස්තීන අධිකාරය (පීඒ) පිහිටුවීමට මග පෑදුවේ ය. එමගින් නිර්මානය කලේ ඊස්රායලය මත මුලුමනින්ම රඳා පවත්වන්නාවූ පාලනයකි. පලස්තීන ජනතාව මත පොලිස්කාරකම එයට පැවරුනු නමුත්, විදේශ පිලිවෙත ආරක්ෂාව, ඊස්රායල් ජනාවාසවල ආරක්ෂාව, දේශසීමා හා ඊස්රායලයට ඇතුල්වන ස්ථානවල පාලනය තනිකරම ඊස්රායලයට පැවරුනි.

කම්කරුවන් හා ගොවීන් අත් විඳි පහත් හා අන්ත දුගීභාවය හමුවේ, පලස්තීන ධනපතියන් තමන් පොහොසත් වීමට, විශේෂයෙන්ම ජාත්‍යන්තර නය හා ආධාර පරිහරනයේ ඒකාධිකාරය සතු කර ගැනීම මගින්, උත්සාහ කල අතර පලස්තීන අධිකාරය අසීමිත වංචනිකත්වයෙන් අංගලක්ෂිත විය. ඊස්රායලය කෙරෙහි වූ කිසියම්ම හෝ සියලු විරුද්ධත්වයන් අවසන් කල යුතු බවට පලස්තීන අධිකාරියට තව තවත් නිර්දය නියෝග පැනවුනු අතර නිලධරයේ දූෂනය මගින් ජනනය කල නොසතුට ද සමග එක්ව නිර්මානය වූ දේශපාලන රික්තය පිරවීමට හමාස් සංවිධානයට අවස්ථාව සැලසී ය.

එක්සත් ජනපදය හා ඊස්රායලය ඇලුම් කල නියෝජිතයා ලෙස මතුව ආ අබ්බාස්, ෆටා සංවිධානය තුල සිටි වඩාත් පෙරලිකාරී කොටස් කොන් කිරීමට ක්‍රියා කලේ ය. නාමික පලස්තීන රාජ්‍යයක් අවසාන වසයෙන් පිලිගැනීම සඳහා, වාසභූමි කරා යලි පැමිනීමේ අයිතිය හා නැගෙනහිර ජෙරුසලම ට කිසිඳු හිමිකම් පෑමක් අතහැර දැමීම ද ඇතුලත් වඩාත් දැඩි කොන්දේසිවලට අත්සන් තැබීමත්, තමන්ගේම ජනතාව මැඩීම ප්‍රතික්ෂේප කිරීමත් නිසා, අරෆාත් හුදකලා කර අපකීර්තියට පත් කිරීමේ දුෂ්ට ව්‍යාපාරයක් මත මෙය මාධ්‍යගත විය.

2000 වසරේ සැප්තැම්බරයේ දී දෙවැනි ඉන්ටිෆාඩා නැගිටීමත් සමග අබ්බාස්, එය නතර කරන ලෙස ඉල්ලා සිටි අතර 2003 දී අගමැති බවට පත් වීම දක්වා වූ ඒ සඳහා ඔහුගේ ඉල්ලීමට විය යුතු පරිදි ම ඊස්රායලයේ හා එක්සත් ජනපදයේ පිටුබලය ලැබුනි. එයට සපුරාම පටහැනි ලෙස ඊස්රායලයේ නිරන්තර මිලිටරි කඩාවැදීම් මධ්‍යයේ අරෆාත්, 2004 නොවැම්බරයේ දී ඔහු මියයන තෙක් ම ඔහුගේ ආන්ඩු නිවාස සංකීර්නය තුල තවමත් පැහැදිලි නොකල හේතු මත හිර කර තැබුනේ ය. ඔහුගෙන් පසුව 2005 ජනවාරියේ දී අබ්බාස් ජනාධිපති ලෙස පත් විය. ඔහුගේ නිල කාලය කුලුගැන්වුනේ සිවිල් යුද්ධයක් හා බටහිර ඉවුරෙහි මුලුමනින්ම පාහේ තනි පුද්ගලයකුගේ ආඥාදායකත්වයක් ලෙස ය.

## ඊස්රායල් කම්කරුවන් සඳහා සියොන්වාදයේ ව්‍යසනකාරී දායාදය

පලස්තීන ශෝකාන්තය ඒ සමග ඊස්රායල් කම්කරුවන්ට ද ඛේදවාචකයක් ලෙස දිගහැරෙමින් තිබීම වැදගත් ය. ජාතිකවාදී ඉදිරි දර්ශනය යුදෙව්වන් සඳහා ද ඔවුන්ගේ අරාබි සමගාමීන්ට නොඅඩු ව්‍යසනයක් වී ඇති බව සනාථ වී තිබේ. තරයේම බංකොලොත් ඊස්රායල පාලක පැලැන්තියට, වඩ වඩාත් ගිනි අවුලුවන හා අදූරදර්ශී මිලිටරි

ප්‍රකෝපකරනයන් හැරෙන්නට වෙනත් ඉදිරි දර්ශනයක් ඇත්තේ නැත.

පලස්තීනුවන් නෙරපා හැරීම මතින් ගොඩනගන ලද ඊශ්‍රායලය ඉන් පසුකාලයේ එහි සමස්ත ඉතිහාසය හා පරිනාමය තුලින් තීරනය කරනු ලැබූ පරිදි අපරාධයක් විය. එහි අසල්වාසීන් හමුවේ කෲර ලෙස පෙනී ගිය රාජ්‍යයක් වූ එහි වර්ධනය සිදු වූයේ, ලෙබනනයේ හා අල්ලාගත් ප්‍රදේශ තුල තිරශ්චීනකමේ දශක ගනනාවකට වගකිව යුතු හා යුදෙව් නොවන්නන්ට එරෙහි නොපනත්කම්වලිනි. ආර්ථිකව ශක්‍ය නොවන එය මේ දක්වා ම ක්‍රියා කර ඇත්තේ, කම්කරු පන්තියේ දේශපාලන හා සමාජ අවශ්‍යතාවන්ට ගැඹුරින්ම සතුරු, දක්ෂිනාංශික හා අන්ත ආගමික ප්‍රවනතාවන් විසින් දේශපාලනිකව ආධිපත්‍යය දරන, එක්සත් ජනපදයේ මිලිටරි කඳවුරක් හා මිලිටරි රාජ්‍යයක් ලෙසට ය.

මැදපෙරදිග ජනතාවන් මුහුන පා සිටින ඓතිහාසික මර උගුලෙන් ගැලවී යාමේ ඉදිරි මාවතක් සම්පාදනය කල හැක්කේ සමාජවාදී ජාත්‍යන්තරවාදයේ ඉදිරිදර්ශනයට පමනි. කම්කරු පන්තිය, අධිරාජ්‍යවාදයටත් අරාබි හා ඊශ්‍රායල තන්ත්‍රයන්හි එහි ධනේශ්වර ඒජන්තයන්ටත් විරුද්ධව පොදු අරගලයක් තුල, ගම්බද දුගීන් තමන් පිටුපසින් ඒකාබද්ධ කරගත යුතු ය.

කලාපයේ පොහොසත් සම්පත්වල වාසි බෙදාහදාගන්නා හා අරාබි, යුදෙව් හා අනෙකුත් වාර්ගික, ආගමික කන්ඩායම්වලට සහජීවනයෙන් වාසය කල හැකි, ලෝක සමාජවාදය සඳහා අරගලයේ කොටසක් ලෙස මැද පෙරදිග එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක්, කම්කරු පන්තියේ අත්‍යාවශ්‍ය ක්‍රියාමාර්ගික අරමුන බවට පත්විය යුතු ය. හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව කැප වී සිටින්නේ මෙම ඉදිරිදර්ශනයට යි.

© www.wsws.org